44 වන පිටෙන්

අප්පොච්චි එහෙම කියද්දී මගෙ හිතටත් මහ සාංකාවක් දැනුණා. ඒත් එක්කම අපේ ස්වාමින් වහන්සේල ගැන ලොකු පැහැදීමකිං මගෙ හිත පිරිල ඉතිරිල ගියා. වේලක් ඇර වේලක් කන අපිට මෙච්චර බඩගින්දරක් දැනෙනව නං උන්නාන්සෙල වේල් ගාණක් මුකුත්ම වළඳන්නෙ නැතුව භාවනා කළේ කොහොමද....! හරිම පුදුමයි....
අම්ම උදේට තම්බපු මයියොක්ක ටික කෙහෙල් කොළ එළපු වටපෙට්ටියෙ දාල හනි හනිකට ලුණු මිරිසක් අඹරංට පටං ගත්ත. මං ළිප ළඟ මැටි මුට්ටියෙ තිබ්බ බෙලිමල් වතුර ටික ලබු කැටේට දැම්ම.
පෑ කාලක් යංටත් කලිං අපි හැමෝම උන්නෙ කංදෙ විහාරෙ. ස්වාමීන් වහන්සේලට දානෙ පූජා කරල අහවර වෙලා අම්මයි අප්පොච්චියි උන්නාන්සෙල ඉස්සරහ දණිං වැටිල සමාව ඉල්ලා හිටිය. කුසගින්දරේ හිටියත් උන්නාන්සෙලගෙ පිං පාට නං ඩිංගක්වත් අඩු වෙලා නෑ. වරු ගාණක් උණත් ඇහිපිල්ලං නොගා ඒ දිහෑ බලං ඉන්ට පුළුහං....

වෙහෙර වහන්සෙයි , බෝධීන් වහන්සෙයි වන්දනා කරල අපි ආපහු එංට පිටත් උණා.අප්පොච්චි කිසි කතා බහක් නැතුව ඉස්සරහිං යනව. අම්මයි මායි උන්දැගෙ පිටිපස්සෙං ඇදෙනව. වෑකණ්ඩිය ළං වෙන කොට මෙච්චර වෙලා කිසිම හාවක් හූවක් නැතුව උන්නු අප්පොච්චි එතන නතර වෙලා හිඳිල ගියපු මහ වැව දිහෑ බලං උන්න.

''අපේ ගමට අම්මෙක් වගෙ තිබ්බිච්චි වැවනේ මේ හිඳිල ගිහිං තියෙන්නේ ....''
අප්පොච්චි ලොකු හුස්මක් ඇරං ඔහේ පිටකරල දැම්ම.අම්මත් ඒ දිහෑ බලාන හූල්ලංට පටං ගත්ත.

දෙවට ළඟිං අප්පොච්චි හේන දිහෑවට යංට හැරුණා. මායි අම්මයි හීං සීරුවෙ ගෙදර ආව. දවාලට උයංට ගේ හරියෙ තිබුණෙ අම්ම එක්කහු කරපු හුණ්සාල් හුණ්ඩු බාගයක් විතරයි. මයියොක්ක සෙරොම ටික පංසලට පූජ කරපු හංද බත් කංට මාළුපිණී මොකවත්ම නෑ. ඒ උණාට අම්ම උන්නෙ පුදුමාකාර සංතෝසෙකිං.. තමංට නැති බැරි වෙලාවක කංට තියන බත් පත හරි දං දෙන එක මහ විසාල පිනක් කියලයි අම්ම කියන්නෙ.

හුණ්සාල් ටික ලිපේ තියාපු අම්ම වත්ත පල්ලෙහාට ගියේ පළා කොළ කඩංට වෙන්ටැති. ගෙදර ඉංට කම්මැලි හංද මටත් අප්පොච්චිගෙ හේන දිහෑවට යංට හිතුණා. ගිනි ගහන අව් කාස්ටෙක්ම අප්පොච්චි මයියොක්ක හිටවංට වලවල් හාරනව. උන්දැගෙ පිට දිගේ වතුර බිංදු වගේ දාඩිය බේරෙනව. උදේට මොකුත් කාපු නැති හංද මගෙ බඩත් කෑගහනව. මං හීං සීරුවෙ එරමිණිය ගාල පැත්තට හැරුණා. එරමිණිය ගාල වෙනදට වඩා එළි පේළි වෙලා. ළඟ තිබ්බිච්චි මාන පඳුරු , කටු අකුල් සේරෝම උදලු ගාල. ඒ විතරක් යැ !. එතන පොළව හතරැස් කොටුවක හැඩේට සුද්ද පවිත්තර කරල. එකත් එකටම මේක අප්පොච්චිගෙම වැඩක් වෙංට ඕනෑ. මං විගහට දුවගෙන ගියේ අප්පොච්චිගෙං ඒ ගැන අහංට හිතාගෙන.ඒත් අප්පොච්චි වැඩ පොළ කරන වෙලාවට කතා බහට කැමති නැති හංද මං නිස්සද්දවම එතෙන්ට වෙලා බලං උන්න.

ටික වෙලාවක් යනකොට අම්ම වට පෙට්ටියත් ඉහේ තියාගෙන හේන දිහෑවට එනව. මං දුවගෙන ගිහිං අම්මගෙ අතේ තිබ්බිච්චි ලබු කැටේ ඉල්ල ගත්ත. අම්ම වෙනදටත් කලියෙං ඇඹුල ඇරං ඇවිල්ල. අප්පොච්චිත් උදලු කෙටියයි අලවංගුවයි ගහක් මුලිං තියල ලබු කැටෙංම මුණ අතපය හෝදගෙන කෝං ගහ යට වාඩි උණා. අම්ම වටපෙට්ටියෙ තිබ්බිච්චි නෙළුං කොළ තුන එළියට ඇරං බත් බෙදංට පටං ගත්ත. ඉස්සෙල්ලම බෙදුවෙ අප්පොච්චිට. පළාකොළ මැල්ලුමයි...නෙළුං අල මාළුවයි...දකිනකොටත් කටට කෙළ උණනව. අපි තුංදෙනාම කෝං ගහ යට ඉඳගෙන බඩ පිරෙනකං සප්පායං උණා. අම්මට නං තියෙන්නෙ හරි පුදුම අත් ගුණයක් !
. රොසලිනා පුංචම්මගෙ මඟුල් ගෙදරදි කාපු කෑම පිඟානටත් වඩා, වත්ත පිටියෙං හොයාගත්තු පළාකොළ ටිකයි...වැවෙං ගලවගත්තු නෙළුං අල ටිකයි එක්ක කන මේ බත් කටවල් දෙක තුන කොච්චර නං රහයි ද ?

සප්පායං වෙලා අහවර උණාට පස්සෙ අප්පොච්චි කෝං ගහ යටම ටිකක් ඇල වුණා. අම්ම උන්දැගෙ නහර වැල් ඉලිප්පුණු කකුල් දෙකයි අත් දෙකයි දිහෑ බලාගෙන කල්පනා කරංට පටං ගත්ත. මං ඉතිං පුරුදු විදිහටම එරමිණිය ගාල දිහෑවට ගෑටුව.

****************************

ටික දොහක ඉඳල අප්පොච්චි වෙනදාටත් කලියෙං හේනට යංට පටං ඇරං. වෙනද වගේ දවල් වරුවට ඉඳල හිටල ගෙදර එන්නෙත් නෑ..එරමිණිය ගාලට එපිටහිං හතරැස් කොටුවක හැඩේට සුද්ද පවිත්තර කරල තිබ්බිච්චි ඉඩං කොටහෙ අප්පොච්චි කාටත් හොරෙං මැටියෙං මොකක්දෝ දෙයක් හදනව. මං දෙතුං දොහක් එරමිණිය ගාලට මුවා වෙලා ඒ දිහෑ බලං උන්න. පස්සෙං පහු මට තේරුං ගියා අප්පොච්චි හදන්නෙ පුංචි සෑයක් කියල. ඒත් මං ඒ ගැන දන්න වගක් අප්පොච්චිට අඟවන්නෙ නැතුව උන්න. දෙතුං විඩක් හේනට එන අම්මවත් තාම මේ සෑය දැක්කෙ නෑ. මාත් මේ වගක් අම්මට නොකිය ඉංට වග බලා ගත්ත.

කොහොමිං කොහොම හරි අප්පොච්චිගෙ උසටම වාගෙ සෑයත් හැදුණා. මං එරමිණිය ගාලට මුවා වෙලා ඒ දිහෑ බලං උන්නු වග අප්පොච්චි තේරිල තිබුණා. ඔහොම ඉඳල සෑයට සුදු හුණු පිරියං කරන වෙලේ පුදු මෙකට වගේ අප්පොච්චි මටත් අඬගැහුව. අපේ සම්මා සම්බුදු පියාණන් වහන්සෙ වෙනුවෙං සෑයක් හදන පිනේ වටිනාකොම ගැන අප්පොච්චි මට කියල දුන්න. සෑයට සුදු හුණු පිරියං කරල අහවර උණායිං පස්සෙ අප්පොච්චිගෙ ඉහේ මලක් පිපුණා වගේ. කංදෙ විහාරෙ සෑය තරං විසාල නැති උණාට අප්පොච්චි හදාපු මේ පුංචි සෑයත් කිරි පාටට ලස්සනට දිළිහෙනව.

" ඇයි අප්පොච්චි අපි මේ ගැන අම්මටත් කියන්නෙ නැත්තෙ ? "

මං අප්පොච්චිගෙං එහෙම ඇහුවෙ බයෙං බයෙං.

" මේ වගක් උඹලැ අම්මගෙ කටිං ගමේ ගෑණුංට එළි උණානං එහෙම අපි මේ සෑය හදලත් හමාරයි කොලුවෝ...මේ වගේ පිංකං ගමට අඬ බෙර ගහල කරංට නාකයි. සෑය හදල අහවර වෙනකල් මං මේක කාටවත් නොකිය උන්නෙ ඒ හංද තමා.දැං ඉතිං ගමේ ඇයංටත් දැනුං දීල ස්වාමීන් වහන්සේල වඩම්මවල පිරිතක් කියංට ඕනෙ. "

අප්පොච්චිගෙ හිතේ තියන සංතෝසෙ මුණෙංම පේනව.එදා අම්ම ඇඹුල ගෙනාපු වෙලාවෙ අප්පොච්චි මට රාජකාරියක් බාර දුන්න.

" කොලුවො , අම්මත් එක්කාසු කරගෙන සෑය වටේට මල් ටිකක් හිටෙව්වොත් නාකද ?... උන්දැත් යන තැනකට පිනක් කරගංට එපායෑ . "

එහෙම කියපු අප්පොච්චි කෝං ගහ යට ඇලවුණා. මං අම්මවත් කැංදගෙන සෑය ළඟට ගියා. සෑය දකිනකොටම අම්ම දෝත් මුදුන් තියාගෙන සාදුකාර දෙංට පටං ගත්ත. ඊට පස්සෙ අම්මයි මායි ගෙදර හිටෝල තිබ්බ දාස්පෙති, අටපෙති , රුකත්තන , ගැටපිච්ච මල් පැළ ගෙනැල්ල සෑය වටේටම හිටෙව්ව. අම්ම සෑ මළුව අමදින අතරෙ මං මල් පැළ වලට වතුර දැම්ම.ඊළඟ දවසෙ අපි තුං දෙනාම පහළ ඔයෙං සුදු වැලි ගෙනැල්ල සෑ මළුවෙ ඇතිරුව.

දන්නෙම නැතුව සුමානයක් ගෙවිල ගියා. දැං මල් පැළ වල පාට පාට ලස්සන මල් පිපිල. පළාතම සුවඳයි.
අද ස්වාමීන් වහන්සේල වඩින දවස. අප්පොච්චියි මායි සුදු පිරුවට එළල උන්නාන්සෙලට ආසන පිළියෙළ කළා. මුළු ගමේම උදවිය සුදු ඇඳුං වලිං සැරහිලා පිංකමට එක්කාසු උණා. හැමදෙනාගෙම හිත්වල සංතෝසෙ දෝරෙ ගලනව.

ටික වෙලාවකිං වෑකණ්ඩිය දිගේ ස්වාමීන් වහන්සේල පේළියට වැඩම කළා. මට උන්නාන්සෙලාව ඈතට පේන්නෙ ලස්සන කිණිහිරිය මල් අමුණපු මාලයක් වගේ.

" අපේ දුටුගැමුණු මහ රාජෝත්තමයං වහංසෙ කිසිම දාක මහ සඟරුවනට පූජ නොකර බෝජනයක් වළඳල නෑ. ඒත් එක..ම එක දොහක් සඟරුවනට පූජ නොකර ලුණු මිරිසක් අනුබව කරංට උන්නාන්සෙට සිද්ද උණා...ඒ වැරැද්ද හංද තමයි ඒ උත්තමයං වහංසෙ මිරිසවැටිය දාගැබ හදල සම්බුද්ධ සාසනේට පූජ කළේ...මේ නියං කාලෙ දානෙ ඩිංගක් නැතුව අපේ පිංවත් ස්වාමීන් වහන්සේල කුසගින්දරේම බාවනා කළා. එදා මට බැරි උණා උන්නාන්සෙලගෙ කුසගින්දර නිවංට. ඒ වැරැද්ද හංද තමයි මං මගෙ අත් දෙකෙං ම මේ සෑ රජාණන් වහංසෙ ඉදි කළේ...ඒ වැරැද්දට මේ පිංවත් මහා සංඝරත්නෙං මට සමාව ලැබේවා !....

අප්පොච්චි ඇස් දෙකේ සතුටු කඳුළු පුරෝගෙන එහෙම කියනකොට ගමේ උදවිය පුදුමෙං බලං උන්න.ස්වාමීන් වහන්සේල මේ පිනේ ආනිසංස කියා දීල පිරිත් දේසනාව පටං ගත්ත. අපි හැමෝම දෝත් මුදුනෙ තියල වැඳගෙන සද්දාවෙං පිරිත් කිව්ව. මුළු ගමේම ඇයොංගෙ පිරිත් හඬ වටාපිටාවෙ දෝංකාර දෙංට පටං ගත්ත. අප්පොච්චිගෙ හිතේ සංතෝසෙ ඉහවහා ගිහිල්ල. අම්ම කඳුළු වගුරන්නෙ හිතේ තියන සද්දාවට...

ටික වෙලාවකිං මුළු අහසම කළු පාට වළාකුළු වලිං පිරිල ගියා. වැහිලිහිණියො සිංදු කිය කියා ඉගිල්ලෙංට පටං ගත්ත. මුළු ඇඟම හීතල කරගෙන හුළඟක් හැමුව. වැහි බිංදු එක දෙක පොළවට වැටෙංට පටං ගත්ත. ගමේ උදවිය පුදුමෙං ආකාසෙ දිහෑ බැලුව. අප්පොච්චිගෙ මුණෙ හීං හිනාවක් ඇඳුණා.පිරිත් දේසනාව අහවර උණා. හැමෝම එක හඬිං සාදුකාර දෙංට පටං ගත්ත.ඒත් එක්කම වේලිලා ඉරිතැලිල තිබ්බිච්චි මහපොළව තෙමාගෙන මහා වරුසාවක් ඇද හැළුණා. මාස ගාණකිං වැහි පොදක් දැකපු නැති ගමේ උදවිය අහසිං මුතු වරුසා කඩාහැළෙනව වාගෙ ආයෙ ආයෙත් සාදුකාර දුන්න. අප්පොච්චිගෙ හිතේ උතුරන සද්දාව ඒ සේරටෝම වඩා ඉහළිං බැබළි බැබළි තිබුණා.




